රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි - 04/2012

මගේ අංකය : EST-9/LNGUE/05/0081
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2012 අගෝස්තු මස 30 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
සංස්ථා ප්‍රධානීන්.

**<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා භාවිතය පිළිබඳ විධිවිධාන.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2006.12.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2006 සහ 2010.09.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක: 03/2010 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ උපදෙස් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව රාජ්‍ය ආයතනයක් වෙත සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන ලිපියකට එම භාෂාවෙන්ම පිළිතුරු යැවිය යුතු වුවද, දෙමළ භාෂාවෙන් එවනු ලබන ලිපිවලට පිළිතුරු යැවීමේදී එම භාෂාවෙන් පිළිතුරු නොයවන බවට වාර්තා වී තිබේ.

03. එහෙයින් ආයතනයක් මඟින් හෝ පුද්ගලයෙකු විසින් එවනු ලබන ලිපි වලට පිළිතුරු යැවීමේදී පහත සඳහන් පරිදි කටයුතු කිරීමට පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

I ලිපිය එවනු ලබන භාෂා මාධ්‍යයෙන්ම (සිංහල,දෙමළ හෝ ඉංග්‍රීසි) පිළිතුරු යැවීම.

II පිළිතුරු ලිපිය අත්සන් කරන නිලධාරියාට එම භාෂා මාධ්‍යය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොමැති නම්, හුරු රාජ්‍ය භාෂාවකින් ලිපිය අත්සන් කර, ලද ලිපියේ භාෂා මාධ්‍යයෙන් පරිවර්තනයක් යැවීම.

III චක්‍රලේඛ වැනි පොදු උපදෙස් නිකුත් කිරීමේදී භාෂාත්‍රයෙන්ම නිකුත් කිරීම.

පී.බී. අබේකෝන්
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.